AL/2020/22/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

22 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :

✳ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. (i) ලෝකයේ ග්ලැසියර පිහිටි ප්‍රධාන ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිම්න ග්ලැසියර ප්‍රදේශවල ඛාදනය සිදුවන ආකාර **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) මහාද්වීපික ග්ලැසියර ප්‍රදේශවල ඛාදන ක්‍රියාව මගින් නිර්මාණය වන භූ රූප **තුනක්** සුදුසු රූප සටහන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) මහාද්වීපික ග්ලැසියර ප්‍රදේශවල නිධිසාධනය මගින් නිර්මාණය වන භූ රූප **තුනක්** සුදුසු රූප සටහන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

2. (i) කෙපන්ගේ ලෝක දේශගුණික වර්ගීකරණයෙහි ප්‍රධාන දේශගුණ වර්ග **හතරක්** අදාළ අක්ෂර සහිතව නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) කෙපන්ගේ ලෝක දේශගුණික වර්ගීකරණයෙහි ඔබ උගත් එක් වර්ගයක් තෝරාගෙන එහි කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) නිරිතදිග මෝසම් සෘතුවේදී ශ්‍රී ලංකාවට ලැබෙන වර්ෂාපතනයෙහි භූගෝලීය ව්‍යාප්ති රටාවේ ප්‍රධාන ගති ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ස්වාභාවික වෘක්ෂලතාවරණය කෙරෙහි නිරිතදිග මෝසම් වර්ෂාව බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) 'ස්වාභාවික උපද්‍රවය' සහ 'ආපදාව' යන යෙදුම්වලින් අදහස්වන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන ස්වාභාවික උපද්‍රවවලින් ඕනෑම **එකක** කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න.

(a) ගංවතුර (b) නායයෑම් (c) භූමිකම්පා (ලකුණු 06 යි)

(iii) ඔබ ඉහත (ii) හි තෝරා ගන්නා ලද ස්වාභාවික උපද්‍රවයෙන් මානව පරිසරයට ඇති බලපෑම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ආපදා කළමනාකරණ චක්‍රයෙහි පෙර-සූදානම් අවධිය සඳහා ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ගෙන ඇති පියවර **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

4. (i) බියෝමවල වෙනස්කම් හඳුනාගැනීමට ඉවහල්වන සාධක **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සෞම්‍ය කලාපීය වනාන්තර බියෝමයෙහි හෝ මධ්‍යධරණී වන ලැහැබ් බියෝමයෙහි ප්‍රධාන ගති ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ කෘත්‍රිම තෙත්බිම් නිසා ඇතිවී තිබෙන පාරිසරික ගැටලු **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) කෘත්‍රිම තෙත්බිම් ආශ්‍රිත පාරිසරික ගැටලු අවම කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න.

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. 1950-55 සිට 2015-20 දක්වා කාල පරිච්ඡේද තුළ ලෝකයේ දළ මරණ ශීඝ්‍රතාව (අනුපාතිකය) පිළිබඳ දත්ත වගුව **1** හි දක්වා ඇත.

වගුව **1**: ලෝකයේ දළ මරණ ශීඝ්‍රතාව

කලාපය	**1950-55**	**1970-75**	**1990-95**	**2010-15**	**2015-20**
වඩා දියුණු රටවල්	10.6	9.5	10.0	9.9	10.2
අඩු දියුණු රටවල්	23.1	12.9	8.9	7.2	7.0
අප්‍රිකාව	26.7	18.7	14.3	9.3	8.2
ආසියාව	22.6	12.0	8.0	6.9	6.9
යුරෝපය	11.2	10.2	11.2	10.9	11.0
ලතින් ඇමෙරිකාව සහ කැරිබියන්	15.5	9.5	6.5	6.0	6.3
උතුරු ඇමෙරිකාව	9.5	9.2	8.6	8.1	8.6
ඕෂනියාව	13.3	9.5	7.6	6.9	6.8

මූලාශ්‍රය : United Nations, Population Division, World Population Prospects, 2019

(i) 'දළ මරණ ශීඝ්‍රතාව' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) වගුව **1** හි අඩංගු දත්ත ඇසුරෙන්, ලෝක දළ මරණ ශීඝ්‍රතාවේ කැපීපෙනෙන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි ඔබ සඳහන් කළ කැපීපෙනෙන ලක්ෂණවලින් දෙකක් තෝරාගෙන, එක් එක් ලක්ෂණයට බලපා ඇති සාධක **දෙක** බැගින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) නිදහසින් පසු කාලයේදී ශ්‍රී ලංකාවේ දළ මරණ ශීඝ්‍රතාව පහත බැසීමට හේතු වූ සාධක **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

6. (i) ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකර්මාන්තයෙහි භාවිත කෙරෙන නව තාක්ෂණික ශිල්පක්‍රම අයත්වන අංශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි සඳහන් කළ එක් අංශයක් තෝරාගෙන, ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා එය දායක වී ඇත්තේ කෙසේ දැයි නිදසුන් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) කෘෂිකර්මාන්තයේ භාවිත නව තාක්ෂණික ශිල්ප ක්‍රමවල අහිතකර බලපෑම් **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

(iv) ඉහත (iii) හි ඔබ සඳහන් කළ අහිතකර බලපෑම් අවමකර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

7. (i) 'නිෂ්කර්ෂක කර්මාන්තයක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ලෝකයේ යපස් නිධිවල භූගෝලීය ව්‍යාප්ති රටාවේ කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝක යපස් වෙළඳාමේ ප්‍රවණතා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ලෝකයේ නිෂ්කර්ෂක කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

8. (i) 'සංචාරකයා' යන යෙදුමෙන් අදහස් වන්නේ කවරෙක් ද? (ලකුණු 02 යි)

(ii) සංචරණයෙහි ප්‍රභේද **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

***